# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## සිංහල

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය :.................................................... 2024.08

| 9 ශ්‍රේණිය | I පත්‍රය හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

### I වන කොටස

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.
- තද කළු අකුරින් මුද්‍රිත යෙදුම්වල අර්ථය සොයන්න.

01. අක්කා කළ ක්‍රියාව **''අපේ මූණේ දැලි ගෑවා වගේ''** යැයි කියමින් තාත්තා ඇයට බැණ වැදුණේය.
(1) ප්‍රීතියට පත් කළා.
(2) අවමානයට ලක් කළා.
(3) දියුණුවට පත් කළා.
(4) විනාශය ළං කළා.

02. ඔය **වැල්වටාරම්** නැතුව සිද්ධිය කෙටියෙන් කියන්න.
(1) බොරු කතා.
(2) ආදර කතා.
(3) ප්‍රවෘත්ති සවිස්තරව.
(4) අනවශ්‍ය විස්තර.

03. ''අව් ගත්තෝ අව්යෙන්ම නසිති'' යනු,
(1) රූඪියකි.
(2) ප්‍රස්තාව පිරුළකි.
(3) ආප්තෝපදේශයකි.
(4) යුගල පදයකි.

- හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

04. සාහිත්‍යය යනු ................ මාධ්‍ය කොටගෙන හැඟීම් ප්‍රබලාකාරයෙන් දැනවීම සඳහා මානවයා ගොඩනගා ගත් මාර්ගයකි.
(1) භාෂාව
(2) කවිය
(3) චින්තනය
(4) හැඟීම්

05. ජන කතාව ...................... අයත් සාහිත්‍යාංගයකි.
(1) භාෂාවට
(2) දේශයට
(3) ජනශ්‍රැතියට
(4) සිංහලයට

06. උපන් බිම පිළිබඳව තම හදවත තුළ නැගෙන සාඩම්බර හැඟීම ............................ යි.
(1) දේශාභිමානය
(2) දේශාටනය
(3) දේශපාලනය
(4) දේශනය

07. සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර හා ව්‍යඤ්ජන ගණන නිවැරදිව දක්වෙනුයේ,
(1) ස්වර 10 ව්‍යඤ්ජන 20
(2) ස්වර 08 ව්‍යඤ්ජන 16
(3) ස්වර 18 ව්‍යඤ්ජන42
(4) ස්වර 42 ව්‍යඤ්ජන18

08. ''ක, ඛ, ග, ඝ, ඞ ' අයත් වන්නේ,

1. 'ක' වර්ගයට
2. 'ච' වර්ගයට
3. 'ට' වර්ගයට
4. 'ප' වර්ගයට

09. තාලුජ අක්ෂර පමණක් අඩංගු වරණය වනුයේ,

1. ක, ඛ, ග, ඝ, ඞ
2. ච, ඡ, ජ, ඣ, ඤ
3. ට, ඨ, ඩ, ඪ, ණ
4. ත, ථ, ද, ධ, න

10. නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ප්‍රමානය, ශ්‍රවනාගාරය, පුෂ්ප, ඖෂධ
2. වෙරළාසන්න, පැරනි, අනුශාසනය, ණයකරු
3. විශ්වකෝෂය, විරෝධාර, පෝසණය, දර්ශණය
4. ආශීර්වාදය, තාක්ෂණය, සුළඟ, සුවිශේෂ

11. ''දෙමාපියෝ'' යන්නෙහි අනුක්ත පදය වන්නේ,

1. දෙමාපියෝ
2. දෙමාපියෝ විසින්
3. දෙමාපියන්
4. ඔවුහු

12. එක් පදයකට පමණක් අර්ථයක් ඇති යුගල පද සහිත වරණය තෝරන්න.

1. හට්ටි මුට්ටි, ගමන් බිමන්, රට තොට, උඩ යට
2. පොත පත, ගම රට, රෙදි පෙරෙදි, කන බොන
3. ගමන් බිමන්, ඉඩම් කඩම්, කොල්ලො කුරුට්ටො, ඔප්පු තිරප්පු
4. ලට්ට පට්ට, කසු කුසු, කැවිලි පෙවිලි, නඩුහබ

13. පහත සඳහන් ග්‍රන්ථ නාම අකාරාදි පිළිවෙළට සකස් කළ විට නිවැරදි පිළිතුර වනුයේ,

1. බුත්සරණ, පූජාවලිය, අමාවතුර, සද්ධර්මරත්නාවලිය
2. අමාවතුර, පූජාවලිය, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය
3. සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, අමාවතුර, බුත්සරණ
4. පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ, අමාවතුර

14. මුලින් දී ඇති පදවලට සමාන පද පමණක් අඩංගු වරණය වන්නේ,

1. සඳ = චන්ද්‍රයා, තාරපති, රුවනාර, හිමකර
2. සතුට = සොම්නස, සතොස, ප්‍රමෝදය, සතුට
3. ජලය = දිය, සයුර, අඹ, වතුර
4. මුහුද = සමුදුර, රුවනාර, සයුර, දිය

15. විරුද්ධාර්ථ පද අතර නොගැළපෙන පදයක් යෙදී ඇති වරණය තෝරන්න.

1. වංක - අවංක, ගරු - නිගරු, බිය - සැක, කළු - සුදු
2. බල - දුබල, ගඳ - සුගඳ, උස - මිටි, පිපුණු - පරවුණු
3. ලස්සන - කැත, අහස - පොළොව, කිලිටි - නොකිලිටි, දිවා - රෑ
4. ඇතුළත - පිටත, දුප්පත් - පොහොසත්, ගැහැනු - පිරිමි, උණුසුම - සීත

- 16 - 17 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

16.
1. තාරකාවෝ රාත්‍රී අහසේ බබළයි.
2. ඔවුන් අනුරාධපුරයේ වන්දනාවේ ගියහ.
3. නිළියක් මනහර රැඟුමක් පෑවාය.
4. මා ද ඔවුන් සමග යමි.

17.
1. තුරු පෙළ සුළඟට සෙලවෙති.
2. සභා තොමෝ සතුටින් විසිර ගියහ.
3. සමහරෙකු අනුන්ගේ යහපත උදෙසා වැඩ කරති.
4. තුරු මුදුන්වල සියොත් කැල නද දෙති.

18. ''<u>මල් ගොමු ගුමු ගුමු</u>'' ගන්වන්නී
ඉහත කාව්‍යයේ ඉරි ඇඳි කොටසේ කාව්‍යාලංකාරය වන්නේ,

1. උපමා
2. රූපක
3. එළිසමය
4. අනුප්‍රාසය

19. ''මග දිගට ජන කතා '', ''කළු කුහර'' යන ග්‍රන්ථ ලියූ ලේඛකයන් පිළිවෙළින් දැක්වෙන වරණය වනුයේ,

1. ස්ටීවන් හෝකින් , පණීභාරත
2. ඩී.පී. වික්‍රමසිංහ , ස්ටීවන් හෝකින්
3. සුනිල් සාන්ත , කුමාරතුංග මුනිදාස
4. මාර්ටින් වික්‍රමසිංහ , ස්ටීවන් හෝකින්

20. ''ලප සේ සඳ විලසේ '', මහ දන සිටුපුවත යන පාඩම් උපුටා ගත් මුල් කෘති වනුයේ,

1. වෙස්සන්තර ජාතක කාව්‍ය, සද්ධර්මරත්නාවලිය
2. ගුත්තිලය , බුත්සරණ
3. පන්සිය පනස් ජාතක පොත, වෙස්සන්තර ජාතක කාව්‍ය
4. මගදිගට ජනකතා , අමාවතුර

(2×20=40)

## II කොටස

- II කොටස සඳහා පිළිතුරු වෙනම ම කොළයක ලියන්න.
- 1 හා 2 ප්‍රශ්න අනිවාර්යයි. වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න 3ක් තෝරාගෙන පිළිතුරු ලියන්න.
- මෙම කොටසට නියමිත ලකුණු ගණන 60කි.

01. පංති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(i) බිත්ති පුවත්පත සඳහා වූ ක්‍රියාකරකමට ඔබ තේමා කර ගත් මාතෘකාව කුමක් ද? (ල.02)

(ii) ඒ සඳහා ඔබ කණ්ඩායම ඉදිරිපත් කළ නිර්මාණය කුමක් ද? (ල.02)

(iii) එම නිර්මාණය සකස් කිරීමේ දී ඔබගේ ගුරුතුමා හෝ ගුරුතුමිය දුන් උපදෙස් දෙකක් ලියන්න. (ල.02)

(iv) ඔබේ නිර්මාණය සඳහා ඔබ තොරතුරු සපයා ගත් ක්‍රම දෙකක් ලියන්න. (ල.02)

(v) නිර්මාණය සකස් කිරීමේ දී ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න. (ල.04)

(vi) මෙම බිත්ති පුවත් පත සකස් කිරීමෙන් ඔබට ලැබුණු කුසලතා දෙකක් ලියන්න. (ල.04)

(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මග පෙන්වීම් හොඳින් කියවා ඉන් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) අතීත වීර රජ දරුවන් මුතුන් මිත්තන් කළ දස්කම් විස්කම් නිසාත්, සුවිශේෂී පිහිටීම ඉසුරුමත් බව, ස්වභාව සෞන්දර්යය නිසාත් ශ්‍රී ලංකාව ලොව දස දෙස ප්‍රසිද්ධ වී ඇත. ''මගේ රට මට අගෙයි'' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

(ආ) රූපවාහිනිය හා පරිගණකය අපට බොහෝ තොරතුරු දැනගත හැකි මාධ්‍යයන් වේ. ඒවා අධ්‍යාපනය සඳහා භාවිත කළ හැකි වටිනා මාධ්‍යයන් දෙකකි. එහෙත් දරුවෝ ඉන් නිසි ප්‍රයෝජන නොගනිති. එය බොහෝ විට විනාශය සඳහා ම යොදා ගනිති. මේ කරුණු සලකා බලා ''රූපවාහිනිය හා පරිගණකය අධ්‍යාපනයට උදව්වක් කර ගනිමු'' මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) කැලි කසළ පරිසරයට බැහැර කිරීම අද විශාල ප්‍රශ්නයක් වී ඇත. අක්‍රමවත් ලෙස ඒවා පරිසරයට බැහැර කිරීම තුළින් පරිසරය දූෂණය ඉහළ ගොස් ඇත. මේ තත්ත්වය මගහරවා සුන්දර සුවදායි පරිසරයක් නිර්මාණය කර ගැනීමේ කාර්යය අපම සතුවන්නේ ය. මේ අදහස මතු වන සේ ''කසළවලින් තොර ලොවක් '' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඊ) පාසල ඇරී ගෙදර පැමිණි සුරංග වත්ත පහළට ගියේ එහි සිටින කුරුල්ලන් බැලීමට ය. මොහොතකින් උණ පඳුරු දෙසින් සතෙකු කෑගසන හඬ ඇසුණි. මෙතැන් පටන් සිදු වූ සිදුවීම. නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනයක් ලෙස ගොඩනගන්න.

(ලකුණු 14)

03. (අ) ඔබ පාසලේ පැවැත්වෙන වාර්ෂික විවිධ ප්‍රසංගය 2024.08.31 දින ප.ව.6.00 පාසලේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා ප්‍රවීණ රංගධර රවීන්ද්‍ර රන්දෙනිය මහතාය. මෙම කරුණු උපයෝගී කොට ගෙන දෙමාපියන් වෙත යැවෙන ආරාධනා පතක් පිළියෙල කරන්න.

නැතහොත්

(ආ) ඔබ පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව 2024 සැප්තැම්බර් 24 වන දිනට යෙදී ඇත. ඔබ එහි ප්‍රධාන සංවිධායක වසන්ත රත්නායක ගුරු මහතා යැයි සිතා චාරිකාවට අවශ්‍ය බස් රථ වෙන් කරවා ගැනීමට අංක 178 සීගිරි මාවතේ පිහිටි හංසගිරි ප්‍රවාහන සේවයේ කළමනාකරු වෙත යැවෙන ව්‍යාපාරික ලිපියක් පිළියෙල කරන්න. (චාරිකාව සඳහා යන ස්ථානය පිටත්වන වේලාව යන කරුණු ලිපියට ඇතුළත් කරන්න.)

(ලකුණු 10)

04. පෙළ පොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(i) මම ලක්දිව බොහෝ විහාරස්ථාන වන්දනා කළෙමි. මට වන්දනා කර ගන්නට බැරි වූයේ ශ්‍රී පාද පද්මය පමණය.

- මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

(ii) මහධන සිටුපුත්තුගේ කතා වස්තුව උපුටා ගත් මුල් කෘතිය හා එහි කතුවරයා කවරෙක් ද?

(iii) ''ඕවි හෙලෙයි හෙලෙයියා'' කිනම් වර්ගයේ කවි විශේෂයක් ද?

ධීවර භාෂාවේ දි 'අම්බාවෝ' යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?

(iv) පහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
.........................................
.........................................

(v) කුඹුක් අත්ත ගඟට වැටී
වතුර අත ගගා
දක්ක ද පැණි කුරුල්ලෙකුට
වතුර ඉහිනවා

මෙම කවිය උපුටා ගත් පද්‍ය පන්තියේ නම හා එහි කතුවරයා නම කරන්න. (ලකුණු 2×5=10)

05. පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

1. ගොවියෝ කුඹුරු වපුරති.
2. නිළිය මනහර රංගනයක යෙදුණාය.
3. සිඟන්නා සිඟාගෙන ආ බත් බුදියි.

- පහත සඳහන් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවන්න.

4. උපාසිකාව විසින් මල්පහන් පූජා කෙරේ.
5. ගවයෙකු විසින් කරත්තය අදිනු ලබයි. (ලකුණු 2×5=10)

2024 . 08 . සිංහල .

06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

සාගරයේ වෙසෙන ජීවීන් අතර කැස්බෑවා සුවිශේෂී සත්ත්වයකු වන සාගරයේ ජීවත් වන උරගයකු ලෙසද හඳුන්වයි. වායුගෝලයේ ඔක්සිජන් ශ්වසනය කරමින් සාගරයේ ජීවත්වන මොවුන් වසර දස ලක්ෂ සියයකටත් ඈත අතීතයේ සිට පරිණාමය වෙමින් වර්තමානය දක්වා ගමන් කර ඇති බව විද්‍යාත්මකව සාධක මගින් ඔප්පු වේ. කැස්බෑවුන්ගේ ශරීර උෂ්ණත්වය අනුව වෙනස් වන බැවින් උදය කාලයේ දී සාගරය මතුපිටට පැමිණ සූර්ය කිරණ මගින් උෂ්ණත්වය වැඩි කර ගනී. මොවුන් පෙනහළු මගින් වාතය ආශ්වාස ප්‍රාශ්වාස කරන අතර රාත්‍රිය ගෙවා දමන්නේ සාගර පත්ලේ ඇති ගුහා හෝ පැලුම් තුළට වී නිදා ගනිමින. වඳවී යන සත්ත්ව විශේෂයක් ලෙස නම් කර ඇති කැස්බෑවන් වර්ග 07 ක් ලොව පුරා දැකිය හැකි වන අතර එයින් වර්ග 05 කට අයත් කැස්බෑවන් ශ්‍රී ලංකා මුහුදු තීරයේ දී දැක බලා ගත හැකියි.

(i) සාගරයේ වෙසෙන ජීවීන් අතර සුවිශේෂී සත්ත්වයෙකු ලෙස හඳුන්වන මෙහි සඳහන් සත්ත්වයා කවරෙක් ද?

(ii) මෙම සත්ත්වයාගේ සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) මොවුන් දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී වෙසෙන ස්ථාන මොනවා ද?

(iv) ලොව පුරා කැස්බෑවුන් වර්ග කීයක් දැකිය හැකි ද? ඉන් ලංකා මුහුදු තීරයේ කීයක් දැකිය හැකි ද?

(v) වඳවීගෙන යන සත්ත්වයෙකු වන්නේ කවරෙක් ද? (ලකුණු 2×5=10)

07. පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන කවි දෙකක් නිර්මාණය කරන්න.

(i) සුන්දර රාත්‍රියක්

(ii) රළ නැගෙන මහ මුහුද

(iii) උදය

(iv) කුරුල්ලෝ (ලකුණු 2×5=10)

Learning Resource Center
R
De Mazenod College
Kandana

REGISTRAR
De Mazenod College
Kandana.